# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2024

**7 ශ්‍රේණිය** | **ගණිතය**

නම/ විභාග අංකය: ......................................... කාලය පැය 2 යි

**I කොටස**

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. එක් එක් ප්‍රශ්නයට ලකුණු 2 බැගින් හිමිවේ.**

1) සුළු කරන්න. $5\frac{2}{5} + 3\frac{1}{5}$

2) අගය සොයන්න.
   i. $56.75 \div 10 =$ .....................
   ii. $0.765 \times 100 =$ .....................

3) මෙම රූපයේ සමමිති අක්ෂය අඳින්න.



4) අගය සොයන්න. $5 + 6 \times 2 - 1$

5) $x \times x \times x \times y \times y$ ප්‍රකාශනය දර්ශක ආකාරයෙන් ලියා දක්වන්න.

6) දිනකට සහල් $1kg\ 350g$ ක් අවශ්‍ය නිවසකට සතියක් සඳහා අවශ්‍ය වන සහල් ප්‍රමාණය සොයන්න.

7) පහත රූපයේ එකිනෙකට සමාන්තර පාද යුගලය ලියා දක්වන්න.




8) කිරි $7l\ 200ml$ බෝතල් 4කට සමාන ප්‍රමාණ වලින් දමන ලදි. එක් බෝතලයකට දමන ලද කිරි ප්‍රමාණය කොපමණද?

9) ක්‍රි.ව. 1900 අධික අවුරුද්දක් වේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

10) පොතක දිග හා පළල පිළිවෙළින් $25cm$ සහ $18cm\ 3mm$ වේ. එහි පළලට වඩා දිග කොපමණ වැඩිද?




11) ගැළපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.
මෙම රූපයෙන් දැක්වෙන්නේ ..................... (උත්තල / අවතල)
සවිධි .... ................. (පංචාස්‍රයකි / ෂඩාස්‍රයකි)



12) $a = 2$ සහ $b = 5$ නම් $a + 3b$ ප්‍රකාශනයේ අගය සොයන්න.

13) දී ඇති ප්‍රකාශනය නිවැරදි නම් ✓ ලකුණ ද වැරදි නම් ✗ ලකුණ ද ප්‍රතිචාර තීරයේ ලකුණු කරන්න.

| | ප්‍රතිචාර |
|---|---|
| කෝණයක විශාලත්වය ස්ථිර අගයක් ඇති කෝණ ගතික කෝණ ලෙස හඳුන්වයි. | (......) |
| සුළු කෝණ දෙකක එකතුව කිසිවිටෙකත් සරල කෝණයක් නොවේ. | (......) |

14) සමචතුරස්‍රාකාර හැඩැති පන්ති කාමරයක පරිමිතිය $40m$ වේ. එහි වර්ගඵලය සොයන්න.

15) සුළු කරන්න. $10x + 7y - 10y - 4x$

16) $8 \ = 2 \times 2 \times 2 \qquad = 2^3$
$12 = 2 \times 2 \times 3 \qquad = 2^2 \times 3$
$24 = 2 \times 2 \times 2 \times 3 \qquad = 2^3 \times 3$ නම් කුඩා ම පොදු ගුණාකාරය ලියන්න.

17) $2 + (-3)$ සංඛ්‍යා රේඛාව ඇසුරින් අගය සොයන්න.




18) උචිත පද වලින් හිස්තැන් සම්පූර්ණ කරන්න.
i. පාදවල දිග අනුව මෙය ..................... කි.
ii. කෝණවල විශාලත්වය අනුව මෙය ..................... කි.




19) $3\frac{2}{5}$ විෂම භාගයක් ලෙස ලියන්න.

20) $A = \{$ 1 සිට 10 තෙක් 2 හි ගුණාකාර $\}$ අවයව සගල වරහන තුළ ලිවීමෙන් $A$ කුලකය ලියා දක්වන්න.

## II කොටස

- **පළමු පශ්ය සහ තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 16ක් ද අනෙක් සෑම ප්‍රශ්නයකටම ලකුණු 11 බැගින් ද ලකුණු හිමිවේ.**

---

01) ඔබ ඉගෙන ගත් වෘත්ත පාඩමට අදාළව කරන ලද ක්‍රියාකාරකම් සිහිපත් කරගන්න.

a) වෘත්ත ඇඳීම සඳහා භාවිතා කරන ගණිත උපකරණ කට්ටලයේ ඇති උපකරණය නම් කරන්න.

b) පහත වෘත්තාකාර රූපයේ AD යනු වෘත්තය සමාන කොටස් දෙකකට බෙදන ලද සරල රේඛාවකි. මෙම රූපය ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




i. වෘත්තයේ කේන්ද්‍රය නම් කරන්න.
ii. අරයයන් දෙකක් ලියන්න.
iii. විශ්කම්භය නම් කරන්න.
iv. $BO$ හා $AD$ අතර ඇති සම්බන්ධතාව ලියන්න.

c) අරය $3.5cm$ වන වෘත්තයක් අඳින්න.

d) පහත රූපය ඇසුරින් දී ඇති වගුව ඔබේ පිළිතුරු පත්‍රයේ සටහන් කරගෙන හිස්තැන් පුරවන්න.

| ත්‍රිකෝණ වර්ගය | ත්‍රිකෝණයේ නම |
|---|---|
| 1. සමපාද ත්‍රිකෝණයක් | |
| 2. සමද්විපාද ත්‍රිකෝණයක් | |
| 3. විෂමපාද ත්‍රිකෝණයක් | |
| 4. සෘජුකෝණී ත්‍රිකෝණයක් | |
| 5. සුළුකෝණී ත්‍රිකෝණයක් | |
| 6. මහාකෝණී ත්‍රිකෝණයක් | |




02)

(a) සෘජුකෝණාස්‍රයක දිග සෙන්ටිමීටර් $x$ වේ. එහි පළල දිගට වඩා $5cm$ කින් අඩු වේ. එහි පරිමිතිය $P$ ලෙස ගත් විට

i. එහි පළල $x$ ඇසුරින් ලියන්න.
ii. එහි පරිමිතිය $P$ සඳහා සූත්‍රයක් $x$ ඇසුරෙන් ගොඩනගන්න.
iii. එම සූත්‍රය හැකිතාක් සුළු කරන්න.
iv. $x = 12cm$ නම් සෘජුකෝණාස්‍රයේ පරිමිතිය වන $P$ හි අගය සොයන්න.

(b) සමීකරණය විසඳන්න. $5a - 4 = 51$

03)

(a) 0.96 භාගයක් ලෙස ප්‍රකාශ කර සරලම ආකාරයෙන් දක්වන්න.

(b) අගය සොයන්න.

i. $4.897 \times 100$
ii. $78.59 \div 1000$
iii. $16.98 \times 14$
iv. $95.94 \div 9$

04) කවකටුව, cm/mm පරිමාණය සහිත සරල දාරය, කෝණමානය භාවිත කර පහත නිර්මාණය එකම රූපයක දක්වන්න.

i. $AB = 4cm$ වන රේඛා ඛණ්ඩයක් නිර්මාණය කරන්න.
ii. $A$ කේන්ද්‍රය ද $AB$ අරය ද වන වෘත්තය නිර්මාණය කරන්න.
iii. $B\hat{A}C = 120°$ වන ලෙස $C$ ලක්ෂ්‍යය වෘත්තය මත ලකුණු කරන්න.
iv. $ABC$ ත්‍රිකෝණය සම්පූර්ණ කරන්න.
v. $A\hat{B}C$ හි අගය මැන ලියන්න.
vi. $ABC$ ත්‍රිකෝණය කෝණ අනුව කුමන වර්ගයේ ත්‍රිකෝණයක් ද?

05)

(a)

i. පැත්තක දිග $6cm$ වන ඝනකයක පරිමාව සොයන්න.
ii. රූපයේ පරිදි දිග, පළල සහ උස පිළිවෙළින් $12cm, 5cm$ හා $4cm$ වන ඝනකාභ හැඩැති භාජනයක පරිමාව සොයන්න.




(b) රූප සටහනේ දක්වෙන පරිදි $ABCD$ සෘජුකෝණාස්‍ර ඉඩමේ $AB$ දිග $60m$ සහ $AD$ පළල $40m$ වේ. ඉඩමේ දෙපැත්තකට මායිම් වන ලෙස $5m$ පළල පාරක් ඇත.
පාරේ වර්ගඵලය සොයන්න.




06)

i. 32, පාදය 2 වූ දර්ශක අංකනයෙන් ලියන්න.
ii. 180, පාද ප්‍රාථමක සංඛ්‍යා වූ බලවල ගුණිතයක් ලෙස ලියා දර්ශක ආකාරයෙන් ලියන්න.
iii. $5x^3y^3$ ගුණිතයක් ලෙස විහිදුවා ලියන්න.
iv. $x = 5, y = 2$ නම් $x^3y^2$ අගය සොයන්න.
v. $2^3$ ...... $3^2$ හිස්තැනට සුදුසු සංකේතය යොදන්න. (> , <)

07)

(a)

i. $2\frac{3}{4}$ විෂම භාගයක් ලෙස ලියන්න.
ii. $\frac{11}{7}$ මිශ්‍ර සංඛ්‍යාවක් ලෙස ලියන්න.
iii. පහත හිස්තැනට ගැළපෙන සංකේතය යොදන්න.
a) $2\frac{1}{4}$ ....... $2\frac{3}{8}$ b) $5\frac{2}{3}$ ....... $\frac{17}{3}$
iv. සුළු කර පිළිතුර සරලම ආකාරයෙන් ලියන්න.
a) $1\frac{3}{5} + 5\frac{1}{2}$ b) $4\frac{2}{3} - 2\frac{1}{6}$

(b) නාමල් තම ඉඩමෙන් $\frac{3}{8}$ ක් තම පුතාට ද $\frac{1}{4}$ ක් දියණියට ද බෙදා දුනි. දියණියට වඩා පුතාට වැඩිපුර ලැබුණු කොටස කොපමණද?

PARCEL NO

# LOL.lk BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

## ඕනෑම පොතක් ඉක්මනින් නිවසටම ගෙන්වා ගන්න






**කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book ගුරු අතපොත්**

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර, කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

## සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**